ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

වාර්ෂික වාර්තාව

2015

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
නො. 27, වොක්ෂෝල් මන්දිරය,
වොක්ෂෝල් පාර,
කොළඹ - 02.

2017.11.20

ලේකම්තුමා,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,
73/1, ගාලු පාර,
කොළඹ - 03.

ලේකම්තුමනි,

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව - 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තියේ නියමයන්ට අනුකූලව පහත සඳහන් ලේඛන සමග 2015 වර්ෂය සඳහා වූ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමු.

අ) 2015 වර්ෂයේ මූල්‍ය වාර්තා
ආ) විගණකාධිපති වාර්තාව
ඇ) යථෝක්ත (ආ) පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම්

ස්තූතියි.

මෙයට විශ්වාසී,
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

අත්සන් කලේ,
හුසේයින් අහමඩ් බහිලා
සභාපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

අන්තර්ගතය	පිටු අංකය
01. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව - 2015	01 – 04
02. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව පිළිබඳ තොරතුරු	05
03. ආයතනික තොරතුරු	06
04. මානව සම්පත් පිරිස් බලය	07
05. ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සභාපතිගේ වාර්තාව	08
06. 2011සිට 2015 දක්වා වසර 5ක් සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය	09
07. 2011සිට 2015 දක්වා වසර 5ක් සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශනය	10
08. විගණන කමිටු සභාපතිගේ වාර්තාව - 2015	11
09. විගණන වාර්තාව - 2015	12 – 28
10. 2015.12.31න් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය	29
11. 2015.12.31ට මූල්‍ය තත්ව ප්‍රකාශනය	30
12. 2015.12.31ට හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය	31
13. 2015.12.31ට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	32
14. 2015.12.31න් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ සටහන් හා ප්‍රතිපත්ති	33 – 41
15. 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම	42 – 47

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2015 වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1.0 පසුබිම

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.
ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව" ලෙස සංශෝධනය කරන ලදි.

කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අප සංස්ථාව 1985 පෙබරවාරි 01වන දින සිට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලදි. ඉන් පසු 1997 ජුනි 19 වන දින සිට 2010 අප්‍රේල් මාසය දක්වා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී ඉන් අනතුරුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා 2015 පෙබරවාරි මාසය දක්වා එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. වර්තමානය වන විට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

2.0 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය

දැක්ම

"ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන පහසුකම් සැපයීම සහ එහි පුරෝගාමියා වශයෙන් මගපෙන්වීම් කිරීම"

මෙහෙවර

"ගුණාත්මකභවින් යුතු සිමෙන්ති සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන රටේ පවතින අවශ්‍යතාවයට සරිලන පරිදි සැපයීම"

ප්‍රධාන ක්‍රියාකාරකම්

1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් සංස්ථාවේ කාර්යන් හා පරමාර්ථ ලෙස පහත දැ ප්‍රකාශයට පත් කර ඇත.

- සිමෙන්ති නිෂ්පාදනය හා විකිණීම
- සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට් වලින් නිෂ්පාදනය කරනු ලබන දුරකථන සහ විදුලි පණිවුඩ හුවමාරු කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය ආදීය නිපදවීම හා අලෙවි කිරීම
- ඕනෑම පුද්ගලයෙකුට විදුලි බලය තොග වශයෙන් සැපයීම
- එසේම, 1964 මැයි 11 දිනැති අංක 14033 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් 1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද "සිමෙන්ති නිෂ්පාදනය හා බෙදාහැරීම" වෙනුවට " සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා විකිණීම" ලෙස ඇතුලත් කරන ලද.

ප්‍රධාන පරමාර්ථ

සංස්ථාවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම වේ.

එසේම, සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමද සංස්ථාවේ අරමුණු අතර වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වල රු.1,083,618,910/-ක් 1981දී ආයෝජනය කරන ලද අතර එහි කොටස් ප්‍රාග්ධනයෙන් 62.45%ක හිමිකාරීත්වය දරනු ලැබේ. කොටසක සම මිල රු.10/-ක් වේ. 2015 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී එහි කොටසක වෙළඳ පොළ අගය රු.8.20ක් වූ අතර දෙසැම්බර් මාසයේදී එහි අගය රු.7.90ක් විය. මෙම ආයෝජනයට අදාල ප්‍රතිලාභ මෙතෙක් සංස්ථාවට ලැබී නොමැත. 2010 අප්‍රේල් මාසයේ සිට 2016 පෙබරවාරි 25 දක්වා සංස්ථාව හා සමාගම එකම අධ්‍යක්ෂ මණ්ඩලයක පාලනය හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, සීමාසහිත ලෆාර්ජ් මහවැලි මෙරීන් සිමෙන්ති සමාගමේ කොටසක අගය රු. 10/-ක් වූ කොටස් 320,000ක ආයොජනයක් සිදු කර ඇති අතර 1995 දෙසැම්බර් 31 දින එම කොටස් දෙකකට එකක් ලෙස වූ ප්‍රසාද කොටස් නිකුතුවෙන් පසු එම සමාගමේ මුළු කොටස් හිමිකාරීත්වය 480,000ක් විය. එය මුළු කොටස් හිමිකාරීත්වයෙන් 10%ක් වේ.මෙම ආයොජනයට අදාලව 1999දක්වා ප්‍රතිලාභ සංස්ථාවට හිමිවුනි. නැවත 2014 වර්ෂයට අදාලව රු.1,728,000/-ක් ලාභාංශ වශයෙන් 2015 වර්ෂයේදී හිමි විය.

3.0 වර්තමාන තත්වය

සංස්ථාව සතුව තිබූ පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාව හා රුහුණු සිමෙන්ති කර්මාන්තශාලාව ජනතාකරණයට භාජනය වීමත්, මට්ටක්කුලියේ පිහිටා තිබූ කඩදාසි මළු ඒකකයේ අයිතිය මහාභාණ්ඩාගාරයට මාරු කිරීම නිසාත්, දැනට සංස්ථාව සතු වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව පමණි. එම කර්මාන්තශාලාවද උතුරේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් 1990 ජුනි මස සිට වසා දමා ඇති අතර එම භූමිය ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේ පවතී.

සිමෙන්ති නිෂ්පාදන කටයුතු නවතා දමා ඇති බැවින් සංස්ථාව විසින් 2008 වර්ෂයේ සිට සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත වූ අතර 1997 වර්ෂයේ සිට කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීමේ නිරත විය.

2016 වර්ෂයේදී රජය විසින් හඳුන්වාදෙනු ලැබූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ සේවකයින් 36 දෙනෙකු 2016.07.31ට විශ්‍රාම යන ලදි.

(අ) සිමෙන්ති ආනයනය හා අලෙවිය :

අවම මිලකට ඉහළ ගුණත්වයෙන් යුතු සිමෙන්ති අවසන් පාරිභොගිකයා වෙත සැපයීම සඳහා 2008 වර්ෂයේ සිට සිමෙන්ති ආනයනය කර “කන්කේසන්” වෙළඳ නාමය යටතේ අලෙවි කිරීම සිදු කරන ලදි. 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සිමෙන්ති මෙට්‍රික් ටොන් 219,559ක් ආනයනය කර ඇත.

එසේම 2013 ,2014 හා 2015 යන වර්ෂ වලදී පිළිවෙලින් සිමෙන්ති මෙට්‍රික් ටොන් 20,300ක්, 18,900 ක් හා 1,540ක් ලෙස ආනයනය කර ඇත.

<u>**සිමෙන්ති අලෙවිය**</u>

වර්ෂය	**2013**	**2014**	**2015**
ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)	20,512	19,812	2,780
වටිනාකම (රු.)	**317,967,355**	**273,160,258**	**37,872,483**

(ආ) <u>**කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීම :**</u>

කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම 1997 ඔක්තෝබර් මාසයේදී සංස්ථාව විසින් උරුම්පිරායි ප්‍රදේශයේ ආරම්භ කර ඇත. මෙමගින් ප්‍රධාන වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතන වලට කොන්ක්‍රීට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයෙහි නිරත වී ඇත.

2009 වර්ෂයේදී කොන්ක්‍රීට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයට අමතරව කොන්ක්‍රීට් ගල්, තලාංද පදිකා වේදිකා ඇතුරුම්, කම්බි කණු යනාදි නිෂ්පාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, යාපනය විශ්වවිද්‍යාලය සහ සාමාන්‍ය ජනතාව වෙත අලෙවි කිරීම ආරම්භ කරන ලදි.

2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන 16,431ක් සිදු කර ඇත.

එසේම 2013 හා 2014 යන වර්ෂ වලදී පිළිවෙලින් කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන 2,003ක්, 1,674 ක් සිදු කර ඇත. 2015 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 191ක්, පන්තල් කණු 832ක් හා කොන්ක්‍රීට් ගල් 71,771ක් නිෂ්පාදනය කර ඇත.

<u>**කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය**</u>

වර්ෂය	**2013**	**2014**	**2015**
කොන්ක්‍රීට් කණු	1,142	1,670	-
පන්තල් කණු	-	4	810
කොන්ක්‍රීට් ගල්	-	-	54,805
වටිනාකම (රු.මිලියන)	**4.02**	**12.50**	**2.69**

චක්‍ර ලේඛ අංක 02/2016ට අනුව ක්‍රියාත්මක වූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ කොන්ක්‍රීට් ආශිත නිෂ්පාදන අංගනයේ සේවයේ නියුතුව සිටි සේවකයින් 28 දෙනෙකු හා ප්‍රධාන ශාඛාවේ සේවයේ නියුතුව සිටි සේවකයින් 10 දෙනෙකු 2016.07.31දින සිට විශ්‍රාම යන ලදි.

දැනට කොන්ක්‍රීට් ආශිත නිෂ්පාදන අංගනයේ එක් ස්ථිර සේවකයෙකු හා දිනක වැටුප පදනම් කරගනිමින් සේවයේ නියුතු එක් සේවකයෙකු ලෙස සේවකයන් 02ක් සේවයේ නියුතු වේ.

එසේම, ප්‍රධාන කාර්යාලයේ සේවකයන් 13න් දෙනෙකු සේවයේ නියුතු වේ.

(ඇ) ආයතනයේ කාර්‍යසාධනය ඉහළ නැංවීම පිළිබද මධ්‍යකාලීන ක්‍රියාමාර්ග :

සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වේ. ඒ තුලින් ස්ථායී හා කාර්‍යක්ෂම මට්ටමකට ගෙන ඒමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා එහි පරිපාලිත සමාගම වන ලංකා සිමෙන්ති සමාගම ප්‍රතිව්‍යුහගත කල යුතු ආයතන ලෙස හදුනාගෙන කටයුතු සිදු වෙමින් පවතී.

4.0 ලාභදායීත්වය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව , 2011 වර්ෂයේදී රු.මිලියන 2.6ක ලාභයක් උපයා ඇත. 2012, 2013 හා 2014 වර්ෂ වලදී පිළිවෙළින් රු. මිලියන 75ක්, රු. මිලියන 424ක් හා රු. මිලියන 13ක් ලෙස අලාභ දරා ඇත.

2015වර්ෂයේදී විස්තීරණ වියදම් වලට පෙර ප්‍රකාශිත ගණකාධිකරණ ලාභය රු.4,344,849/-කි. එය පෙර වසර හා සසඳන විට 132%ක වර්ධනයක් අත්පත් කරගෙන ඇත. මීට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ රු.16,364,454/-ක වටිනාකමින් යුතු වගකීම් කපා හැරීම් වේ.

5.0 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අනාගත කාර්යභාරය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතින එකම සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තශාලාව කන්කසන්තුරේ කර්මාන්තශාලාව වන අතර යුධමය වාතාවරණය හේතුවෙන් එය 1990 ජුනි මස වසාදැමීමෙන් පසු මේ වන තුරු සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොමැත. එසේම එහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීම පිළිබඳ පුරෝකථනයන්ද සිදුකල නොහැක. නමුත්, නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට අදාල වාර්තා සකස් කර අදාල ආයතන වෙත භාර දී ඇත.

කෙසේ නමුත් මෙම කන්කසන්තුරේ කර්මාන්තශාලාව සහිත භූමිය නැවත සිමෙන්ති සංස්ථාවට භාරදෙන ලෙස ඉල්ලීම් කර තිබුනද වර්තමානය වන විටත් එය භාර දීමට ශ්‍රී ලංකා යුධ හමුදාව කටයුතු කර නොමැත. මෙම භූමිය සංස්ථාවට මුදා හැරීමෙන් අනතුරුව ඊට යෝග්‍ය සංවර්ධන කටයුත්තක් ආරම්භ කල හැකිවේ.

කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශයේදී 2016.10.20වන දින පැවති “2016.07.31 දින ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ ආයතන වල ඉදිරි කටයුතු පිළිබඳ” රැස්වීමේදී ගනු ලැබූ තීරණ 2016.10.27 දිනැති අංක MIN/R/07/06/07 දරණ ලිපිය මඟින් දැනුවත් කල අතර ඒ අනුව අප සංස්ථාව සතු කොල්ලුපිටිය,මන්නාරම, පුත්තලම හා කන්කසන්තුරේ පිහිටා ඇති ඉඩම් සඳහා යෝග්‍ය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ජනිත වන ආදායම් මනා ලෙස කළමණාකරණය කිරීමටත්, ඒ තුලින් සංස්ථාවේ මූල්‍ය තත්වට ශක්තිමත් මට්ටමකට ගෙන ඒමට හා සංස්ථාව ස්ථාවර මට්ටමකට ගෙන ඒමටත් උත්සාහ කරනු ලැබේ.

6.0 සේවය ඇගයීම

2015 වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කටයුතු සඳහා ලබාදුන් මගපෙන්වීම් සම්බන්ධව කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා හට අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටින අතර සංස්ථාවට ලබාදුන් සහයෝගය වෙනුවෙන් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ, ජරමිත ආයතනයේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, රාජ්‍ය බැංකුවල, අනෙකුත් රජයේ ආයතන වල හා සිමෙන්ති නිෂ්පාදන හා අලෙවි කටයුතුවල නියුතු ආයතන වල සේවයේ නියුතු සියලු නිලධාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

එසේම, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සේවයේ නියුතු සේවකයින්හටද අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව පිළිබඳ තොරතුරු

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

දූරකථන අංක : 0112 440 201 , 0112 440 203 හා 0112 440 205

ෆැක්ස් අංක : 0112 440 201

සිමෙන්ති කර්මාන්තශාලාව

කන්කේසන් සිමෙන්ති කර්මාන්තශාලාව, කන්කසන්තුරේ.

කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අංගනය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, උරුම්පිරායි, යාපනය.

දූරකථන අංක : 0213 215 340

බැංකුකරුවෝ

ලංකා බැංකුව, මහජන බැංකුව

විගණකවරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව, අංක.306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

සිමෙන්ති ගබඩාව

පරිපාලිත සමාගම - ලංකා සිමෙන්ති සමාගම

ප්‍රධාන කාර්යාලය

ලංකා සිමෙන්ති සමාගම, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

දූරකථන අංක : 0112 447 746, 0112 399 243

ෆැක්ස් අංක : 0112 447 541

සිමෙන්ති කර්මාන්තශාලාව

සිමෙන්ති කර්මාන්තශාලාව, කිරිමලේ පාර, කන්කසන්තුරේ.

සිමෙන්ති ගබඩාව

නො.472, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 02.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2015 වර්ෂයේ පහත දැක්වෙන අධ්‍යක්ෂවරුන් කළමණාකරණ මණ්ඩලයේ කටයුතු කර ඇත.

01. කේ.ජී.ලීලානන්ද මහතා	සභාපති/කළමණාකරණ අධ්‍යක්ෂ	2015.02.13	සිට
02. රියාස් සාලි මහතා	ක්‍රියාකාරී අධ්‍යක්ෂ	2015.02.16	සිට
03. ඩබ්.ඩී.ජානක මහතා	අධ්‍යක්ෂ	2015.02.25	සිට
04. එම්.එස්.එම්.කබීර් මහතා	අධ්‍යක්ෂ	2015.03.18	සිට
05. එන්.එම්.මුනාවර් මහතා	අධ්‍යක්ෂ	2015.03.31	සිට
06. ඒ.රෂීක් මහතා	අධ්‍යක්ෂ	2015.04.30	සිට
07. ටී.ඔ.ආර්.වනිගරත්න මහතා	අධ්‍යක්ෂ	2015.03.10	සිට
08. එච්.ජී.සුමනසිංහ මහතා	අධ්‍යක්ෂ	2015.03.10	සිට 2015.10.30
09. ඩී.එස්.කොස්තා මහත්මිය	අධ්‍යක්ෂ	2015.10.30	සිට

2016 වර්ෂයේ සිට පහත දැක්වෙන අධ්‍යක්ෂවරුන් කළමණාකරණ මණ්ඩලයේ කටයුතු කර ඇත.

01. හුසේන් අහමඩ් බහිලා මහතා	සභාපති	2015.02.13	සිට
02. එස්. අබීඩීන් එහියා මහතා	කළමණාකරණ අධ්‍යක්ෂ	2016.02.16	සිට
03. ඩබ්.ඩී.ජානක මහතා	අධ්‍යක්ෂ	2015.02.25	සිට
04. එම්.එස්.එම්.කබීර් මහතා	අධ්‍යක්ෂ	2015.03.18	සිට
05. එන්.එම්.මුනාවර් මහතා	අධ්‍යක්ෂ	2015.03.31	සිට
06. ඒ.රෂීක් මහතා	අධ්‍යක්ෂ	2015.04.30	සිට
07. ටී.ඔ.ආර්.වනිගරත්න මහතා	නිරීක්ෂක	2015.03.10	සිට
08. ඩී.එස්.කොස්තා මහත්මිය	නිරීක්ෂක	2015.10.30	සිට

ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුව

01. එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක	ගණකාධිකාරී
02. ඊ.එස්.චාන්දනී	පිරිස් නිලධාරී

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2015.12.31 දිනට මානව සම්පත් පිරිස් බලය

වර්ගය	ජ්‍යෙෂ්ඨ කළමණාකරන	මධ්‍ය කළමණාකරන	කණිෂ්ඨ කළමණාකරන	කළමණාකරන සහකාර	ප්‍රාථමික මට්ටම	එකතුව
ප්‍රධාන කාර්යාලය	-	02	04	09	08	23
කොන්ක්‍රීට් අංගනය	-	-	01	02	26	29
එකතුව	**-**	**02**	**05**	**11**	**34**	**52**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සභාපතිගේ වාර්තාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2015 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව ඉතා සතුටින් ඉදිරිපත් කර සිටිමු.

2015 වර්ෂයේදී අප ආයතනයට ඉතාමත් සැලකිලිමත් විය යුතු වූ අභියෝගවලට මුහුණ දීමට සිදු විය.

මෙම වර්ෂයේදී මුළු ආදායම ලෙස රු.මිලියන 40.57ක් උපයා ඇති අතර පෙර වර්ෂයේ මුළු ආදායම රු.මිලියන 285.66 කි. මෙම වසරේ ශුද්ධ ලාභය රු.මිලියන 4.34ක් වන අතර 2014 වර්ෂයේ ශුද්ධ ලාභය රු.මිලියන 4.34ක් වේ. මෙම වසරේදී ශුද්ධ ලාභයේ වැඩිවීම 131% කි.

2015 වර්ෂයේදී අපගේ ප්‍රධාන ශාඛාවේ සේවකයින් 23 දෙනෙකු හා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන ශාඛාවේ සේවකයින් 29 දෙනෙකු සේවයේ නියුතු විය. ස්වේච්ජා වන්දි යෝජනා ක්‍රමය යටතේ ප්‍රධාන ශාඛාවේ සේවකයින් 10 දෙනෙකු හා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන ශාඛාවේ සේවකයින් 28 දෙනෙකු 2016.07.31 දින විශ්‍රාම යන ලදි.

සංස්ථාව සතු ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපගේ අවධානය යොමු කල අතර ඉන් උපයා ගත හැකි ආදායම තුලින් මුල්‍යාමය වශයෙන් ශක්තිමත් හා ස්ථාවර මට්ටමක් සංස්ථාවට ලගාකරගත හැකි වේ.

කෙසේනමුත් ඉදිරියේදී ස්ථාවර හා කාර්්‍යක්ෂම මට්ටමක් වෙත ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව ලගාකර ගැනීමට උත්සාහ කරනු ලැබේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කටයුතු සඳහා ලබාදුන් සහයෝගය වෙනුවෙන් සියලු දෙනාහට මාගේ ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමු.

අත්සන් කලේ,

හුසෙන් අහමඩ් බහිලා,
සභාපති,
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2011 වසරේ සිට 2015 දක්වා

	2015 රු.'000	පුන ප්‍රකාශය කරන ලද 2014 රු.'000	2013 රු.'000	2012 රු.'000	2011 රු.'000
ආදායම	40,571	285,657	287,913	365,333	656,071
විකුණුම් පිරිවැය	(50,781)	(280,878)	(272,178)	(374,016)	(656,676)
දළ ලාභය/(අලාභය)	**(10,211)**	**4,779**	**15,735**	**(8,683)**	**(605)**
වෙනත් ආදායම්	60,043	34,233	34,885	32,751	35,623
බෙදාහැරීම් වියදම්	(1,904)	(2,951)	(6,670)	(4,906)	-
පරිපාලන වියදම්	(28,249)	(29,211)	(448,079)	(78,899)	(20,873)
මූල්‍ය වියදම්	(15,334)	(20,642)	(20,474)	(15,362)	(11,545)
බදු පෙර ලාභය/(අලාභය)	**4,345**	**(13,793)**	**(424,603)**	**(75,099)**	**2,600**
බදු පිරිවැය	-	-	-	-	-
බදු පසු ලාභය/(අලාභය)	**4,345**	**(13,793)**	**(424,603)**	**(75,099)**	**2,600**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

මූල්‍ය තත්ව ප්‍රකාශනය
2011 වසරේ සිට 2015 දක්වා දෙසැම්බර් 31 දිනට

	2015	පුන ප්‍රකාශය කරන ලද 2014	2013	2012	2011
වත්කම්	**රු.'000**	**රු.'000**	**රු.'000**	**රු.'000**	**රු.'000**
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත උපකරණ	777,878	779,317	779,486	608,596	550,705
දීර්ඝ කාලීනව ලැබිය යුතු දෑ	757,224	757,224	757,223	757,224	757,224
පරිපාලිත සමාගම්වල ආයෝජනයන්	855,458	721,589	678,244	1,090,019	1,090,019
අනෙකුත් මූල්‍ය වත්කම්	35,469	33,428	31,247	28,280	25,526
	2,433,029	**2,291,558**	**2,246,200**	**2,484,119**	**2,423,474**
ජංගම වත්කම්					
තොගය	9,181	18,933	39,024	19,739	20,532
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	80,551	96,247	89,549	84,242	76,972
ඉදිරියට කල ගෙවීම්	-	-	261	244	1,248
මුදල් හා මුදල් සමාන දෑ	8,743	2,076	3,592	4,201	14,071
	98,475	**117,256**	**132,426**	**108,426**	**112,823**
මුළු වත්කම්	**2,531,504**	**2,408,814**	**2,378,626**	**2,592,545**	**2,536,297**
හිමිකම් හා වගකීම්					
හිමිකම්					
කොටස් ප්‍රාග්ධනය	966,971	966,971	966,971	966,972	966,972
පොදු සංචිත	9,997	9,997	9,997	9,997	9,997
ප්‍රත්‍යාගණන සංචිත	713,619	713,619	713,619	536,119	536,119
රඳවාගත් ඉපැයුම්	337,314	333,315	(66,820)	357,783	372,864
විකිණීම සඳහා වන දැහි සංචිත	(227,560)	(368,430)	-	-	-
	1,800,341	**1,655,474**	**1,623,767**	**1,870,871**	**1,885,952**
ජංගම නොවන වගකීම්					
දිගු කාලීන වගකීම්	500,426	519,303	543,914	578,543	492,426
විශ්‍රාම පාරිතෝෂිත අරමුදල	18,697	19,394	18,290	17,952	18,919
	519,123	**538,698**	**562,204**	**596,495**	**511,345**
ජංගම වගකීම්					
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	90,057	93,227	85,224	96,195	62,857
පොලී ගෙවියුතු වගනීම්	93,330	68,515	79,015	2,068	53,665
මුදල් හා මුදල් සමාන දෑ	28,653	52,900	28,416	26,916	22,478
	212,040	**214,642**	**192,655**	**125,179**	**139,000**
මුළු හිමිකම් හා වගකීම්					

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
විගණන කමිටුවේ වාර්තාව - 2015

සංස්ථාවේ විගණන කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විතවේ. කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකතුමා හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතවරයෙකුද නිරීක්ෂකවරුන් ලෙස ඊට සහභාගි වේ.

විගණන කමිටුවේ සභාපති ලෙස එච්.ජී.සුමනසිංහ මහතා 2015 ඔක්තෝබර් මස 30 දින දක්වා කටයුතු කල අතර ඩී.එස්.කොස්තා මහත්මිය 2015 ඔක්තෝබර් මස 30 දින සිට කටයුතු කරනු ලබයි. එම්.එස්.එම්.කබීර් මහතා සහ එන්.එම් මුනාවර් මහතා කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරනු ලැබේ.

විගණන කමිටුවේ වගකීම් හා කාර්යභාරය පහත පරිදි වේ.
අ. වාර්ෂික වාර්තාවන්, ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට හා අනෙකුත් අදාල නීතිමය තත්වයන්ට අනුකුල වන ගෙස සකස්කර තිබේද යන්න් පිළිබදව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දීම.

ආ. අදාල නීති, රෙගුලාසි සහ අනුමත චක්‍රලේඛයන්ට අනුකූලව සංස්ථාව කටයුතු කර තිබේද සහ එසේ අනුකූල නොවන අවස්ථාවන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දී දැනුවත් කිරීම.

ඇ. අභ්‍යන්තර සහ බාහිර විගණන වාර්තා සහ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභාවේ උපදෙස් සලකා බැලීම හා ඒ පිළිබඳ කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට උපකරෙ කිරීම.

ඈ. අභ්‍යන්තර පාලන ක්‍රමයන් සංස්ථාවට හදුන්වා දීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.

සමාලොචිත වර්ෂයේ විගණන කමිටුව විසින් වෙන්ත් කාර්යයන් සමග පහත සදහන් ක්‍රියාකාරකම් වලද යෙදුනි.

- විගණනය නොවූ මාසික මුල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණනය වූ වර්ෂයට අදාල මුල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණක වාර්තා පරික්ෂා කිරීම හා කළමණාකරණය විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම.
- ව්‍යවස්ථාපිත ගෙවීම් පිළිබඳ දැනුවත් කිරීම.

අත්සන් කලේ,

එස්.එම්.පියතිස්ස,
සභාපති
විගණන කමිටුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/ඒ/එස්එල්සීසී/1/04/2015/එෆ්ජී

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 මාර්තු 19 දින

සභාපති,

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2017 පෙබරවාරි 03 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන සී/ස ලංකා සිමෙන්ති සමාගමේ කොටස් හිමිකමෙන් සියයට 62.45 ක් සංස්ථාව සතු වුවද, 2015 වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(අ) සංස්ථාව ප්‍රතිව්‍යුහගතකරණයට ලක් කිරීම හේතුවෙන් වත්කම් ප්‍රත්‍යාගණනය අවශ්‍ය වුවත්, පිරිවැය රු.15,392,480 ක් වූ වාහන 08 ක් ප්‍රත්‍යාගණනය කර වර්තමාන වෙළඳපල අගයට ගලපා නොතිබුණි.

(ආ) ගැසට් පත්‍ර මඟින් 1964 හා 1977 වර්ෂ වලදී සංස්ථාවට පවරන ලද අක්කර 5718 ක පිහිටි ඉඩම්, ගොඩනැගිලි සහ කර්මාන්ත ශාලාව තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය බැංකුවක ණය ගිණුම් 2 ක හා බැංකු ජංගම ගිණුමක් සඳහා බැංකුවෙන් එවන ලද ශේෂ සනාථ කිරීම් අනුව බැංකු ණය පොළී හා අයිරා පොළී එකතුව රු.6,805,093 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එම ණය පොළී සහ අයිරා පොළිය රු.15,271,328 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් බැංකු ණය පොළිය සහ අයිරා පොළිය රු.8,466,235 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ජර්නල් සටහන් 02 ක් මඟින් රඳවාගත් ඉපැයීම් ගිණුමට හර හා බැර කල යුතු පිළිවෙලින් රු.3,388,010 ක් හා රු.19,752,464 ක් එම ගිණුමේ සටහන් නොකිරීම හා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.1,728,000 ක් වූ ලාභාංශ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගලපා නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල තුල්‍යතාවය විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ඇ) මන්නාරම් දිස්ත්‍රික්කයේ පුලියාඩි ඉරක්කම් හි පිහිටි අක්කර 604 ක මැටි සහ හුණුගල් නිධිය සහිත ඉඩම දිගුකාලීන බදු පදනම මත සංස්ථාව වෙත ලබාදී ඇතත්, ඉඩමේ අයිතිය තහවුරු කරගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා අවසාන ගෙවිය යුතු වෙළඳ ගෙවීම්වල වැඩිවීම රු.24,814,414 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ, මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය තුළ කාරක ප්‍රාග්ධනයේ වෙනස ගැලපීමේදී, එම වැඩිවීම රු.11,226,932 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) දිගුකාලීන හා කෙටිකාලීන ණය ලබා ගැනීම් හා ණය ආපසු ගෙවීම් වල ශුද්ධ අගය රු.4,580,014 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම්වල එම ශුද්ධ අගය රු.1,819,094 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2015 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල්වලට සමාන දෑ වල වටිනාකම රු.19,909,145 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම වටිනාකම රු.29,408,442 ක් ලෙස දක්වා තිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.516,185 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) පරිගණක වැඩසටහනක් මඟින් පිළියෙල කර, සංස්ථාවේ ලෙජරය විගණනයට ඉදිරිපත් කර තිබුණි. නමුත් එම ලෙජරයේ තිබූ රඳවා ගත් ඉපැයුම් ගිණුම එම වැඩසටහන මඟින් සකස් නොකර, එම ලෙජර් ගිණුමේ සටහන් වෙනම යතුරුලියනය කර, ලෙජර් ගිණුම මත අලවා තිබීම හේතුවෙන් විගණනයට ඉදිරිපත්කළ ලෙජර් ගිණුමේ නිරවද්‍යතාව පිළිගැනීමට නොහැකි විය.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලෙජර් ගිණුම අනුව වර්ෂය අවසාන දිනට විවිධ අත්තිකාරම් ශේෂය රු.245,946 ක් වූ අතර, විගණනයට ඉදිරිපත්කළ අත්තිකාරම් ලේඛනය අනුව එම ශේෂය රු.116,336 ක් වූයෙන් රු.129,610 ක වෙනසක් පැවතුණි.

(ආ) සංස්ථාවේ ලෙජර් ගිණුම් 04 ක ඉකුත් වර්ෂ අවසාන ගිණුම් ශේෂ සහ ආරම්භක ශේෂ අතර රු.3,770,794 ක වෙනස්කම් පැවතුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ රඳවා ගත් ඉපැයීම් වටිනාකම රු.337,660,694 ක් වූ අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වටිනාකම රු.337,313,622 ක් ලෙස දක්වා තිබීම නිසා රු.347,072 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක 2015 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය රු.148,061 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම ශේෂය රු.1,696,150 ක් ලෙස රු.1,548,089 ක් වැඩියෙන් දක්වා තිබුණි.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.80,551,270 ක් වූ අතර එයින් වසරකට අඩු වූ ණය ශේෂ රු.8,245,359 ක්ද, වසර 1 සිට වසර 3 දක්වා වූ ණය ශේෂ රු.14,323,896 ක් ද, වසර 3 ට වැඩි පැරණි ණය ශේෂ රු.57,982,015 ක් ද විය. මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු බැරකම් ශේෂය රු.93,330,134 ක් වූ අතර, එයින් වසරකට අඩු වූ ණය ශේෂ රු.41,640,831 ක්ද, වසර 1 සිට වසර 3 දක්වා වූ ණය ශේෂ රු.22,459,105 ක් ද, වසර 3 ට වැඩි පැරණි ණය ශේෂ රු.29,230,198 ක් ද විය. මෙම ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනුවල නිවැරදිතාවය විගණනයේදී සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

ගිණුම් විෂයය	වටිනාකම	ඉදිරිපත් නොකළ සාක්ෂි
	රු.	
ඉඩම් හා ගොඩනැගිලි	775,295,981	ස්ථාවර වත්කම් ලේඛන
මෝටර් රථ	15,392,480	සමීක්ෂණ මණ්ඩල වාර්තා
ලී බඩු හා සවි කිරීම්	5,512,601	සමීක්ෂණ මණ්ඩල වාර්තා
උපකරණ හා සන්නිවේදන උපකරණ	1,194,398	සමීක්ෂණ මණ්ඩල වාර්තා
අවසන් තොගය		
කොන්ක්‍රීට් නිෂ්පාදනය	6,104,684	සමීක්ෂණ මණ්ඩල වාර්තා
යාපනය - සිමෙන්ති තොගය	501,461	සමීක්ෂණ මණ්ඩල වාර්තා
දිගුකාලීන ණය	56,293,352	ශේෂ සනාථ කිරීමේ ලිපි

2.2.7 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වගන්තිය	දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු රු.11,548,263 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 371 (2)	ලබාගත් අත්තිකාරම් අදාල කාර්යය නිමවූ විගස පියවිය යුතු වුවත්, එකතුව රු.83,836 ක් වූ අත්තිකාරම් වර්ෂ 2 සිට වර්ෂ 3 දක්වා වූ කාලයක සිට පියවීමට කටයුතු කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 396 (ඈ)	නිකුත් කළ නමුත් මාස 06 ඉක්මවූ එකතුව රු.390,485 ක් වටිනා චෙක්පත් දෙකක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 751	ආයතනය ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.
(iv) මුදල් රෙගුලාසි 756 (1)	2015 වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල පත් කිරීමට කටයුතු කර නොතිබුණි.
(v) මුදල් රෙගුලාසි 757(4)	මුදල් වර්ෂය අවසන් වූ වහාම තම වත්කම් පිළිබඳව සමීක්ෂණයක් පවත්වා එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ	
(i) 5.1.3 වගන්තිය	අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන පිටපත් අයවැය ලේඛනය සමඟ රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කර නොතිබුණි.
(ii) 8.3.9 වගන්තිය	රාජ්‍ය සංස්ථා, මණ්ඩලවල සම්පත් රේඛීය අමාත්‍යාංශයේ කටයුතු සඳහා ලබා නොදිය යුතු වුවත්, 2011 ජනවාරි මාසයේදී රු. මිලියන 4.8 කට සංස්ථාව විසින් මිලදී ගත් කැබ් රථය මිලදී ගත් දින සිට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත මුදා හැර තිබුණි.
(ඈ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 වගන්තිය	ධාවනයෙන් ඉවත් කර තිබූ මෝටර් රථ දෙකක් අපහරණය කිරීමට කටයුතු නොකර ගර්හිත තත්වයේ පැවතුණි.

2.2.8 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 සහ 2015 වර්ෂ වලදී විනෝද චාරිකාවක් සඳහා රු.1,100,000 ක මුදලක් නිසි අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් ජ'නල් වවුචර් 74 ක් පිළියෙල කර තිබුණද එම ජ'නල් වවුචර්වලින් 73 ක් අනුමත කර නොතිබුණි.

(ඇ) ගැසට් නිවේදනයක් මඟින් සංස්ථාව වෙත පවරා තිබූ පුත්තලම පාලවි හි පිහිටි අක්කර 221 ක ඉඩමෙන් අක්කර 50 ක ප්‍රමාණයක් විධිමත් අනුමැතියකින් තොරව 2005 වර්ෂයේදී ආයෝජන මණ්ඩල ව්‍යාපෘතියක් සඳහා පවරා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,344,849 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.13,792,672 ක ඌනතාවයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.18,137,521 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ රු. 19,752,464 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ තුනක් කපා හැරීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී රු.2,600,000 ක ශුද්ධ ලාභයක් පැවතියද, 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව ශුද්ධ අලාභ ලබා නැවතත් 2015 වර්ෂය වනවිට රු.4,344,849 ක ශුද්ධ ලාභ තත්ත්වයක් ඇතිවී තිබුණි. සේවක පාරිශ්‍රමිකය, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී සංස්ථාවේ දායකත්වය, 2011 වර්ෂයේදී රු.33,720,000 ක ධන අගයක් වූ අතර 2012 හා 2013 වර්ෂ වලදී සෘණ අගයක් ගෙන තිබුණි. නැවතත් 2015 වර්ෂයේද රු.38,344,849 ක ධන අගයක් බවට වර්ධනය වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 58 කින් වැඩි වී තිබුණු අතර, ක්ෂණික අනුපාතයද සියයට 87 කින් වැඩි වී තිබුණි. ජංගම වත්කම්වලට වඩා රු.113,564,793 කින් ජංගම වගකීම් වැඩිවීම හේතුවෙන් ජංගම වගකීම් පියවා ගැනීමට තරම්, ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් නොපවතින බැවින්, සංස්ථාවේ ද්‍රවශීලතාවය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයේ රු.285,657,759 ක් වූ විකුණුම් ආදායම සමාලෝචිත වර්ෂයේ රු.40,570,803 ක් දක්වා රු.245,086,956 කින් අඩු වී තිබුණි. මෙසේ විකුණුම් ආදායම අඩුවීමට ප්‍රධාන වශයෙන් 2014 දෙසැම්බර් මාසයෙන් පසු 2015 ජූලි මාසය දක්වා මූල්‍ය දුෂ්කරතා මත සිමෙන්ති ආනයනය කිරීමට නොහැකි වීමත්, සිමෙන්ති ණය පදනම මත අලෙවිය සම්පූර්ණයෙන් නතර කර රාජ්‍ය ආයතනවල සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වී එම ඇණවුම් මත අලෙවිය සිදු කිරීමත් හේතුවී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී රු.4,779,245 ක් වූ දළ ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.10,210,679 ක දළ අලාභයක් වී තිබුණි. දළ අලාභයක් ලැබීමට ප්‍රධාන වශයෙන් සිමෙන්ති නිෂ්පාදන අංශයේ සෘජු පිරිවැය ඉහළ මට්ටමක තිබියදී විකුණුම් විශාල වශයෙන් අඩුවීම බලපා තිබුණි. එසේ දළ අලාභයක් ලබා තිබුණද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත කරන ලද පූර්ව වර්ෂ ගැලපීම් රු.16,364,454 ක් අනෙකුත් ආදායම් යටතේ දැක්වීම මගින් රු.4,344,849 ක ශුද්ධ ලාභයක් ලබා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1959 ජනවාරි 2 දිනැති අංක 11634 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව සිමෙන්ති නිෂ්පාදනය ආනයනය කිරිම හා අලෙවි කිරීම, සිමෙන්තියෙන් නිෂ්පාදිත භාණ්ඩ අලෙවිය හෝ සිමෙන්ති කොන්ක්‍රීට් ඇතුළත් දුරකථන සහ විදුලි පණිවුඩ කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය කිරීම, ඕනෑම පුද්ගලයෙකුට විද්‍යුත් බලශක්තිය තොග වශයෙන් සැපයීම සංස්ථාවේ ප්‍රධාන අරමුණු විය.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිමෙන්ති නිෂ්පාදනය කර අලෙවි කිරීම සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන සංස්ථාවේ ප්‍රධාන අරමුණු වුවත්, පසුගිය යුධමය වාතාවරණය තුළ කන්කසන්තුරේ සිමෙන්ති නිෂ්පාදනය නතර වීමත් සමඟ, වර්තමානය වන විට සිමෙන්ති බෑග් ආනයනය කර අලෙවි කිරීම සහ කොන්ක්‍රීට් නිෂ්පාදන අලෙවිය දක්වා ආයතනයේ මූලික කාර්යය සීමා වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සමඟ කාර්ය සාධන වාර්තාව සැසඳීමේදී සත්‍ය ක්‍රියාකාරීත්වය සන්සන්දනය කළ හැකි පරිදි එම වාර්තාව පිළියෙල කර නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී රු.574,892,000 ක් වටිනා සිමෙන්ති අලෙවි කිරීමට සැලසුම් කර තිබුණද, කාර්යසාධන වාර්තාව අනුව අලෙවි කර තිබුණේ රු.42,060,062 ක් වටිනා සිමෙන්ති පමණි. ඒ අනුව ලඟාකරගත් කාර්ය සාධනය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 7.3 ක් විය.

(ඇ) කොන්ක්‍රීට් කණු ආශ්‍රිත නිෂ්පාදන මත රු.12,000,000 ක ඉලක්කගත ආදායමක් ලබා ගැනීමට සැලසුම්කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.1,026,147 ක ආදායමක් පමණක් ලඟා කර ගැනීම නිසා ලඟා කරගත් කාර්යසාධනය අපේක්ෂිත ඉලක්ක ගත ආදායමින් සියයට 8.6 ක් විය.

(ඉ) කන්කසන්තුරේ කොන්ක්‍රීට් නිෂ්පාදන සහ අලෙවි අංශයේ මුළු ආදායමට වඩා වියදම් දැරීමට සිදු වීම නිසා දිගින් දිගටම අලාභ ලබා තිබූ අතර, පසුගිය වසර නවයක කාලය තුළ ලබා තිබූ අලාභයන් පරීක්ෂා කිරීමේදී රු.30,298 සිට රු.19,526,633 ක් දක්වා පරාසයක අලාභයක් ලබා තිබුණි.

(ඊ) සංයුක්ත සැලැස්මේ ඉලක්කගත ආදායම් හා වියදම් සමාලෝචනය කර ඒවා සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබූ අතර, සංයුක්ත සැලැස්මේ සමාලෝචිත වර්ෂය සඳහා මුළු ඉලක්කගත අලෙවි ආදායම රු.613,662,000 ක් වුවද, ලඟා කරගත් සත්‍ය ආදායම රු.67,235,628 කි. ඒ අනුව ලඟා කරගෙන තිබුණේ ඉලක්කගත ආදායමෙන් සියයට 11 ක් පමණි. 2014 වසරට සාපේක්ෂව 2015 වර්ෂයේදී සිමෙන්ති ආනයනය මෙට්‍රික් ටොන් 17,500 කින් අඩුවීම නිසා, රු. මිලියන 245.08 කින් අලෙවි ආදායම අඩු වී තිබුණි.

(උ) 2015 ක්‍රියාකාරී සැලැස්ම අනුව මුතුරාජවෙල නව සිමෙන්ති ඇසුරුම් කර්මාන්තශාලාව පිහිටුවීම යටතේ, ආනයනිත සිමෙන්ති තොග ඇසුරුම් කර අලෙවි කිරීමෙන් රු.මිලියන 2,055 ක විකුණුම් පිරිවැටුමක් සහ මෙට්‍රික් ටොන් මිලියන 148,500 ක නිෂ්පාදන ධාරිතාවයක් ඉලක්ක කර තිබුණි. සංයුක්ත සැලැස්මේ එම අරමුණු ඇතුළත් කර නොතිබූ අතර, වර්ෂය අවසානයේදී අපේක්ෂිත ඉලක්ක කිසිවක් අත්පත් කර ගැනීමට සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් අක්කර 5352 ක් වූ අරුවක්කාලු පිහිටි හුණුගල් නිධිය 1995 වර්ෂයේදී සිමෙන්ති නිෂ්පාදනය සඳහා හුණුගල් කැණීම් කර ගැනීමට පෞද්ගලික සමාගමකට වසර 50 ක කාල සීමාවකට බදු දී තිබුණි. බදු ගිවිසුම අනුව අයකරගත යුතු වාර්ෂික කුලිය වූ ඇ.ඩො 202,000 කට සමාන වටිනාකම සමාලෝචිත වර්ෂය සඳහා රු.26,664,825 ක් විය. කෙසේ නමුත්, ඇතිකරගෙන තිබූ බදු ගිවිසුමේ වාර්ෂික බදු කුලිය සංශෝධනය කිරීම පිළිබඳ වගන්තියක් ඇතුළත් කර නොතිබීම හේතුවෙන් 2011 අගෝස්තු 16 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම බදු ගිවිසුම සංශෝධනය කිරීමට උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාවට අයත් මන්නාරම් දිස්ත්‍රික්කයේ පුලියාඩි ඉරක්කම්වල පිහිටි අක්කර 604 ක ඉඩමෙන් අක්කර 10 ක ප්‍රමාණයක් නාත්තන් දිස්ත්‍රික් ලේකම් විසින් අවතැන් වූ පවුල් පදිංචි කිරීම සඳහා ලබා දී තිබුණි. මෙම අනවසර පදිංචි කිරීම් පිළිබඳ සොයා බලා ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1967 ජූලි 12 දිනැති අංක 14756/7 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් සංස්ථාවට හිමි වී ඇති පර්චස් 89.9 ක කොල්ලුපිටියේ පිහිටි ඉඩම, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර සමාලෝචන කමිටුවේ නිර්දේශ අනුව විදේශීය ආයෝජකයෙකු වෙත දීර්ඝකාලීනව බදු දීමට කටයුතු කරමින් සිටින බව මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මඟින් දක්වා තිබුණද, ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේදී මෙම දීර්ඝකාලීනව බදු දීමට අදාළව කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ගාල්ල උණවටුන කැස්බෑපාන පිහිටි අක්කර 6 ක් පමණ වන ඉඩමෙහි සුනාමියෙන් විපතට පත් වූවන් සඳහා නිවාස ඉදි කර පදිංචි කර තිබුණි. සංස්ථාවට අයත් මෙම ඉඩමේ හිමිකම් නිරවුල් කර ගැනීමට හෝ වන්දි මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පුත්තලම පාලම් හි පිහිටි ඉඩමෙන් අක්කර 09 ක ඉඩම් කොටසක අනවසර පදිංචිකරුවන් විසින් නිවාස ඉදි කර පදිංචි වී තිබුණි. මේ පිළිබඳව සොයා බලා ඉඩම් හිමිකාරිත්වය නිරවුල් කර ගැනීමට කළමනාකාරිත්වය පියවර ගෙන නොතිබුණි.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සංස්ථාවට අයත් තක්සේරුකර වටිනාකම ගිණුම්ගත නොකළ කන්කසන්තුරේ පිහිටි අක්කර 741 ක් වූ කර්මාන්තශාලාව සහිත ඉඩම සහ රු.395,000 ක් වටිනා ගොඩනැගිලි සංකීර්ණය අධි ආරක්ෂිත කලාපයේ යුධ හමුදාව භාරයේ දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1981 වර්ෂයේදී ආරම්භ කරන ලද සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින් සියයට 62.45 ක හිමිකාරීත්වයක් සංස්ථාව සතු වුවද, එම ආයෝජනය සඳහා පසුගිය වසර 25 ක කාලය තුළ කිසිඳු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලබා දී නොතිබුණි.

(ආ) අන්තර්ජාතික සමාගමකට වන්දි ගෙවීම සඳහා 2012 වර්ෂයේදී රාජ්‍ය බැංකුවකින් ලබාගත් රු.38,704,668 ක් වූ බැංකු ණය සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකතුව රු.10,066,774 ක් ණය පොළී ලෙස ගෙවීම් කර තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අනුමත කාර්යය මණ්ඩලය 76 ක් හා තත්‍ය කාර්යය මණ්ඩලය 53 ක් වූ අතර තනතුරු 23 ක පුරප්පාඩු පැවතුණි. මෙම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් අභ්‍යන්තර පාලනය, වැඩ බෙදීම, අභ්‍යන්තර පරීක්ෂාවන් හා අභ්‍යන්තර විගණන කාර්යයන් කාර්යක්ෂමව ඉටු නොවන බව නිරීක්ෂණය විය.

(ආ) මූලික සුදුසුකම් සපුරා නොමැති නිලධාරියෙකු 2012 වර්ෂයේදී විකුණුම් සහ අලෙවි නිලධාරී ලෙස බඳවාගෙන තිබූ අතර ඔහු විසින් අනුමත ණය සීමාව ඉක්මවා සිමෙන්ති ණය පදනම මත නිකුත් කිරීම හේතුවෙන් රු. මිලියන 6 කට අධික මූල්‍ය පාඩුවක් සිදු වී තිබුණි. ඒ හේතුවෙන් 2015 නොවැම්බර් 04 දින සිට ඔහුගේ සේවය අවසන් කර තිබූ අතර සංස්ථාවට සිදු වූ අලාභය අයකර ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර තිබුණද, එම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 නොවැම්බර් 04 දින සිට පුරප්පාඩු වී පවතින විකුණුම් හා අලෙවි නිලධාරී තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂ 5 තුළ මුළු සේවක සංඛ්‍යාව අඩු වී තිබියදී මුළු සේවක පිරිවැය 2011 වර්ෂයේ දී රු.24,410,000 ක සිට 2015 වර්ෂය වන විට රු.29,840,000 ක් දක්වා රු.5,430,000 කින් ඉහළ ගොස් තිබුණි. ඒ අනුව එක් සේවක සාමාන්‍ය පිරිවැය 2011 වර්ෂයේදී රු.358,970 ක සිට 2015 වර්ෂය වන විට රු.563,018 ක් දක්වා වර්ධනය වී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සිමෙන්ති සංස්ථාවේ 2015 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකශන 2016 දෙසැම්බර් 31 දින දක්වා විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව සැලසුම්ගත කාලපරිච්ඡේදය තුළදී සපුරාගත යුතු අරමුණු හා ඉලක්ක පිළිබඳ කළමණාකරුවන්ගේ වගකීම ක්‍රියාකාරී සැලැස්මේ පැහැදිලිව දක්වා නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 වගන්තිය ප්‍රකාරව මාස තුනකට වරක් කාර්යසාධන වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණු අතර, කාර්තුව අවසන් වී දින 30 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සංස්ථාව විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණන සැලැස්ම අනුව ආවරණය කල යුතු ක්ෂේත්‍ර දක්වා තිබුණද, ඊට අනුකූලව විගණන කටයුතු සිදු කර නොතිබුණු අතර, ප්‍රධාන වශයෙන් භෞතික තොග ගණනය කිරීම සඳහා විගණන කටයුතු සීමා වී තිබුණි.

(ආ) සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය සඳහා එක් නිලධාරිනියක් පමණක් අනුයුක්ත කර තිබුණු අතර, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

5.4 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක් විගණන කමිටු පැවැත්විය යුතු වුවත්, සංස්ථාව විසින් 2015 වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

ණය පදනම මත සිමෙන්ති විකිණීම සඳහා අළෙවි නියෝජිත ධූරය ප්‍රදානය කිරීමේදී ණයට ලබාදෙන වටිනාකමට සරිලන ඇප බැඳුම්කරයක් ලබා නොගැනීම, ණය විය හැකි උපරිම ප්‍රමාණයන් ගිවිසුමේ සඳහන් නොකිරීම, ණය ගෙවීම පැහැර හරින්නන්ගෙන් ණය අයකර ගන්නා ක්‍රමවේදය ගිවිසුමට ඇතුළත් නොකිරීම, ණය ගෙවීමට අපොහොසත්ව තිබියදී නැවත නැවතත් ණයට සැපයීම, බැංකු ඇපකර සඳහා ව්‍යාජ තොරතුරු ලබා දීම, අවිධිමත් පරිදි ණය අනුමත කරන ලද නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග නොගැනීම හා අයවිය යුතු ණය ශේෂ පිළිබඳ පසු විපරම් නොකිරීම වැනි අඩු පාඩු පසුගිය විගණන වාර්තාවෙන්ද පෙන්වා දී ඇතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් රු.52,506,824 ක් වූ මුළු ණය ශේෂය අය කරගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලද අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ)	මූල්‍ය පාලනය	විධිමත් මූල්‍ය පාලන ක්‍රම හඳුන්වා නොදීම, බදු සහ බැංකු ණය වැනි අත්‍යාවශ්‍ය ගෙවීම් සිදු නොකිරීම, බැංකු අයිරා පවත්වා ගැනීම.
(ආ)	ස්ථාවර වත්කම් පාලනය	ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම සහ සමීක්ෂණ මණ්ඩල පත්කර වත්කම් සමීක්ෂණය අවසන් නොකිරීම.
(ඇ)	ගබඩා පාලනය	තොග නඩත්තු කිරීම හා තොග ලේඛන සහ පොත්පත් පවත්වාගෙන යාම සහ තොග හානි සහ ප්‍රමාද ගාස්තු අවම කර ගත යුතු වීම.
(ඈ)	ණයගැති හා ණයහිමි පාලනය	ආයතනයේ ඇති අයවිය යුතු ණය ශේෂ අයකර නොගැනීම, ණය අලෙවියට අදාළ වාර්තා නිසි පරිදි නඩත්තු නොකිරීම සහ ණයහිමියන් ගෙවා නිරවුල් නොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

විස්තීරණ ආදායම් හා රදවා ගත් ඉපැයුම් ප්‍රකාශනය

2015 දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

